NATIONAL SCIENCE FOUNDATION

# පාඨශාලයීය විද්‍යා තරගාවලිය - 2023

## 01. හැඳින්වීම

ජාතික විද්‍යා පදනම මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන පාඨශාලයීය විද්‍යා තරගාවලිය සඳහා ජාතික විද්‍යා පදනමේ ලියාපදිංචි වී ඇති **විද්‍යා සමාජවලින්** (Science societies) අයදුම්පත් කැඳවනු ලැබේ. රජයේ පිළිගත් (රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික) පාසල්වල සිසුන්ට මෙම තරග සඳහා අයදුම් කළ හැකිය.

**පාඨශාලයීය විද්‍යා තරගාවලියේ ප්‍රධාන අරමුණු ඃ**

- "STEAM" තේමාව යටතේ විද්‍යා දැනුම වර්ධනය කිරීම.
- විද්‍යාව ඉගෙනීම සඳහා අභිරුචියක් සහ උද්යෝගයක් ඇති කිරීම මගින් විද්‍යාව ප්‍රවර්ධනය කිරීම.
- සිසුන් තුළ විද්‍යා සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීමට අවස්ථාව සලසා දීම.
- පාසලේ විවිධ විෂය ක්ෂේත්‍රවල සිසුන් හා ගුරුවරුන් අතර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට අවශ්‍ය අන්තර් සබඳතා ගොඩනැංවීම.

පාඨශාලයීය විද්‍යා තරගාවලියේ තේමාව **"යහපත් අනාගතයක් කරා STEAM අධ්‍යාපනය"**

**පාසල් සිසුන් සඳහා සංවිධානය කරනු ලබන තරග :**

- කෙටි විද්‍යා නාට්‍ය (Short Science Drama)
- ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ/ කීර්තිමත් පුද්ගලයන්ගේ චරිතය නිරූපනය කරන භූමිකා රංගනය (Role Play of a renowned personality in the field of STEAM)
- විරිදු (Viridu)
- ගායනා (Song)
- ඩිජිටල් කතාන්දරකරණය (Digital Story)
- විද්‍යා රචනා (Science Essay)
- විද්‍යා කෙටි කතා (Short Science Story - Science Fiction)
- හස්තමය පෝස්ටර් (Hand-painted poster contest)
- අතත්‍ය පාලම් සැලසුම් කිරීමේ තරගය (Virtual Bridge Designing Contest)

## 02. පාසල් සිසුන් සඳහා වන තරගවලට අදාළ පොදු කොන්දේසි :

1. **"යහපත් අනාගතයක් කරා STEAM අධ්‍යාපනය"** යන මැයෙන් සියලුම තරග සංවිධානය කෙරේ.
2. රජයේ පිළිගත් (රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික) පාසල්වල සිසුන්ට මෙම තරග සඳහා අයදුම් කළ හැකිය.
3. ජාතික විද්‍යා පදනමේ පාසල් විද්‍යා සමාජ ජාලයේ ලියාපදිංචි වී නොමැති පාසල් ලියාපදිංචි කරවීමට අයදුම්පත https://www.nsf.gov.lk/index.php/public-outreach/societies/sss වෙබ් ලිපිනයෙන් බා ගැනීම හෝ අප ආයතනය අමතා ලබා ගැනීම කළ හැකිය.
4. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම තරගාවලියට ඉදිරිපත් විය හැකිය. (තරග ජයග්‍රහණය සඳහා ඉදිරිපත් කරනු ලබන භාෂා මාධ්‍ය සලකා බලනු නොලැබේ.)
5. ඉදිරිපත් කරනු ලබන නිර්මාණය 'ස්වයං නිර්මාණයක්' බවට පංති භාර ගුරුතුමා විසින් සනාථ කර පාසලේ විදුහල්පති මගින් ඉදිරිපත් කළ යුතුය.
6. සිසුන් හා ගුරුවරුන් යන දෙපාර්ශවයටම නාට්‍ය පිටපත්, විරිදු පදරචනය සහ ගීත රචනා ඉදිරිපත් කළ හැකිය.
7. ඔබ විසින් එවන ලද නාට්‍ය පිටපත් විනිශ්චය කොට අවසාන වටයට තෝරා ගතහොත් ඒ බව දැනුම් දෙනු ලබන අතර එම නාට්‍ය අවසන් වටය සඳහා වේදිකා ගත කළ යුතුය.

8. ඔබ විසින් එවීමට බලාපොරොත්තු වන භූමිකා රංගන, විරිදු හා ගීත වීඩියෝවක් ආධාරයෙන් එවීමට කටයුතු කළ යුතුවේ.
9. සිසුන් විසින් එවන ලද භූමිකා රංගන, විරිදු හා ගීත වීඩියෝ ඇගයීමෙන් පසුව අවසන් වටයට තෝරා ගනු ලබන නිර්මාණ 10 වේදිකාවක ඉදිරිපත් කළ යුතුවේ.
10. තරගවලට අදාළ ඉදිරිපත් කිරීම් හා ප්‍රදර්ශක සිසුන් විසින් පමණක් ඉදිරිපත් කළ යුතුය.
11. පෝස්ටර් තරගාවලිය සඳහා අතින් අඳින ලද පෝස්ටර් දෙන ලද මාතෘකාව අනුව පිළියෙල කළ යුතුය.

**03. පාසල් සිසුන්ගේ තරගවලට අදාළ කොන්දේසි :**

1) භූමිකා රංගනය

- කාලය : මි.05 (මි.04කට අඩු හෝ මි.06කට වැඩි භූමිකා රංගන ප්‍රතික්ෂේප කරනු ලැබේ.)
- භූමිකා රංගනය **: "යහපත් අනාගතයක් කරා STEAM අධ්‍යාපනය"** විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධන දායකත්වය ලබා දුන්/ දෙන විද්‍යාඥයෙකු හෝ ප්‍රසිද්ධ අයෙකු අලලා ඉදිරිපත් කළ යුතුවේ. එක තරගකරුවෙකුට ඉදිරිපත් විය හැක්කේ එක්වරක් පමණි. වේදිකාවේ ඉදිරිපත් කිරීම එක් සිසුවෙකු විසින් කළ යුතුය. පසුතල නිර්මාණ, රංග වස්ත්‍ර, වේශ නිරූපණය, පසුබිම් සංගීතය යොදා ගැනීමෙන් ඉදිරිපත් කරන ලද භූමිකා රංගනය ආකර්ශනීය විය හැකිය.
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- ඇගයීමේ නිර්ණායක : විද්‍යාත්මක අන්තර්ගතය, නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම සහ වෙනත් භාවිතයන් (පසුතල නිර්මාණ, රංග වස්ත්‍ර, වේශ නිරූපණය, පසුබිම් සංගීතය) සහතික පත් ලබාදෙනුයේ රංගනය ඉදිරිපත් කරනු ලබන සිසුවාට පමණි.
- භූමිකා රංගනය සඳහා යෝජිත නම් :
    - ලියනාඩෝ ඩාවින්සි
    - සර් අයිසැක් නිව්ටන්
    - ආකිමිඩිස්
    - ඇල්බට් අයින්ස්ටයින්
    - මාරි කියුරි
    - ඩේම් ස්ටෙපනී ෂර්ලි
    - රේචෙල් කාර්සන්

2) කෙටි විද්‍යා නාට්‍ය

- කාලය : මි.20 ( මි.18කට අඩු හෝ මි.22කට වැඩි කෙටි විද්‍යා නාට්‍ය ප්‍රතික්ෂේප කරනු ලැබේ.)
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- කණ්ඩායම් සංයුතිය : කණ්ඩායමක උපරිම සිසුන් 25ක් විය යුතුය. පසුබිම් සංගීතය සිසුන්ගෙන් පමණක් සමන්විත වෙනම කණ්ඩායමකට ලබා දිය හැකිය.
- ඇගයීම් සඳහා නිර්ණායක : තේමාවට අදාළ බව සහ අන්තර්ගතය, තිර රචනය, රංගනය, වෙනත් භාවිතයන් (සංගීතය, පසුතල නිර්මාණ, රංග වස්ත්‍ර, වේශ නිරූපණය) සහ අධ්‍යක්ෂණය. හොඳම නාට්‍ය පිටපත, හොඳම වේදිකා නාට්‍ය, හොඳම නළුවා/ නිළිය, හොඳම නිර්මාණකරු (choreographer) අවසන් වටයේ දී තෝරා ගනු ලැබේ.

3) විරිඳු ගායනා

- කාලය : මි.05 (මි.04කට අඩු හෝ මි.06කට වැඩි විරිඳු ගායනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.)
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- කණ්ඩායම් සංයුතිය : විරිඳු ගායනය සඳහා ඉදිරිපත් විය හැකි උපරිම සිසුන් සංඛ්‍යාව 02කි. සංගීතය සපයා ගැනීම ඔවුන් විසින් ම කළ යුතුවේ. විරිඳු ගායනයේ පදරචනය එක්කෝ ඉදිරිපත් කරන්නා විසින් හෝ නැත්නම් වෙනත් සිසුවෙකු හෝ ගුරුවරයෙකු විසින් සිදු කළ හැක.
- ඇගයීම් සඳහා නිර්ණායක : තේමාවට අදාළ බව, ගායනය, සංගීතය හා නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම. හොඳම පිටපත හා ඉදිරිපත් කිරීම අවසන් වටයේ දී තෝරා ගනු ලැබේ.

4) ගීත ගායනා තරගය

- කාලය : මි.05 (මි.04කට අඩු හෝ මි.06කට වැඩි ගීත ප්‍රතික්ෂේප කරනු ලැබේ.)
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- කණ්ඩායම් සංයුතිය : ගීත ගායනා තරගයට ඉදිරිපත් විය හැක්කේ උපරිම සිසුන් 02කි. සංගීත භාණ්ඩ ආධාරයෙන් පමණක් සංගීතය සපයා ගත යුතුවේ. සංගීත භාණ්ඩ ඕනෑම සංඛ්‍යාවක් භාවිත කළ හැකිය. සිසුන් හා ගුරුවරුන්ගෙන් සමන්විත සංගීත කණ්ඩායම උපරිම 05 දෙනෙකු විය යුතුය. ගීත රචනය එම සිසුන් විසින් හෝ වෙනත් ශිෂ්‍යයෙකු හෝ ගුරුවරයෙකු විසින් කළ හැක.
- ඇගයීම් සඳහා නිර්ණායක : තේමාවට අදාළ බව, සංගීතය හා නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම. හොඳම පද රචනය. සංගීතය සහ ගායනය අවසන් වටයේ දී සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමේ ඇගයීම් මගින් තෝරා ගනු ලැබේ.

5) විද්‍යා රචනා තරගය

- වචන ගණන : 750-1000
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- පිටු සැකසුම : රචනාව A4 ප්‍රමාණයේ පිටුවල ටයිප් කළ යුතුය. අකුරුවල විශාලත්වය 12 සහ පේළි අතර පරතරය 15 විය යුතුය. අතින් ලියා ඉදිරිපත් කරන්නේ නම්. අත් අකුරු පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරින් වචන අතර ප්‍රමාණවත් පරතරයක් සහිතව A4 ප්‍රමාණයේ පිටුවල තනි පැතිවල ලිවිය යුතුවේ. කියවීමට අපහසු අත් අකුරු සහිත පිටපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඇගයීම් සඳහා නිර්ණායක : විද්‍යාත්මක කරුණු, නිර්මාණශීලීත්වය, ඉදිරිපත් කිරීමේ විලාසය, භාෂා භාවිතය සහ වාක්‍ය රචනයක තිබිය යුතු අනෙකුත් ගුණාංග.

6) විද්‍යා කෙටි කතා (විද්‍යා ප්‍රබන්ධ)

- වචන ගණන : 750-1250
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- විද්‍යා කෙටි කතාව A4 ප්‍රමාණයේ පිටුවල ටයිප් කළ යුතුය. අකුරුවල විශාලත්වය 12 සහ පේළි අතර පරතරය 1.5 විය යුතුය. අතින් ලියා ඉදිරිපත් කරන්නේ නම්, අත් අකුරු පහසුවෙන් කියවිය හැකි වන ලෙස වචන අතර ප්‍රමාණවත් පරතරයක් සහිතව A4 ප්‍රමාණයේ පිටුවල තනි පැතිවල හෝ ෆුල්ස් කැප්වල තනිපැතිවල ලිවිය යුතුවේ. කියවීමට අපහසු අත් අකුරු සහිත පිටපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඇගයීම් සඳහා නිර්ණායක : විද්‍යාත්මක කරුණු, නිර්මාණශීලීත්වය, ඉදිරිපත් කිරීමේ විලාසය, ගලායාම, භාෂා භාවිතය සහ කෙටි කතාවක තිබිය යුතු අනෙකුත් ලක්ෂණ සලකා බලනු ලැබේ.

7) හස්තමය පෝස්ටර් තරගය

- ප්‍රමාණය : 20"x25 (බ්‍රිස්ටල් බෝඩ් ප්‍රමාණය)
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- මාධ්‍යය : පැස්ටල, දියසායම් ආදී ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකිය.
- ඇගයීම් සඳහා නිර්ණායක : තේමාවට අදාළ බව, නිර්මාණශීලීත්වය, වර්ණ ගැලපීම, පෝස්ටරයේ ගුණාත්මකභාවය

8) ඩිජිටල් කතාන්දරකරණ තරගය

- කාලය : මි.04 (තත්පර 30ක ඉඩක් දෙනු ලැබේ)
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- නිර්මාණය : තේමාවට සම්බන්ධ විද්‍යාත්මක සංකල්පයක් ඩිජිටල් මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතුවේ. ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදනය සඳහා Windows Movie Maker, MS Power Point හෝ වෙනත් පිළිගත් මෘදුකාංගයක් භාවිත කළ හැකියි ඩිජිටල් කතා නිෂ්පාදනය කිරීමේ දී වචන, නිශ්චල රූප, පටිගත කරන ලද ශ්‍රව්‍ය කතා, වීඩියෝ දර්ශන සහ සංගීතය වැනි බහුමාධ්‍ය යොදා ගත හැකිය. (පරිශීලනය කළ හැකි වෙබ් පිටුව: www.storycenter.org).
- පිරිවිතර : වීඩියෝ ගොනු ආකෘති :AVI/MPEG4, දර්ශන අනුපාතය : 16 : 9 පුළුල් තිරය වඩාත් යෝග්‍ය වේ.
- ඇගයීම් සඳහා නිර්ණායක : තේමාවට අදාළ බව, නිර්මාණශීලීත්වය, විද්‍යාත්මක තොරතුරුවල නිවැරදිභාවය හා ඉදිරිපත් කිරීම.
- ඉදිරිපත් කරනු ලබන වීඩියෝවේ පළවන රූපරාමුවේ ඉදිරිපත් කරන්නාගේ මූලික විස්තරයක් නම, පාසල, සම්බන්ධ කර ගත හැකි දුරකතන අංක, ලිපිනය දක්වන්න.

9) අත්‍යතා පාලම් සැලසුම් කිරීමේ තරගය

- කාලය : මි. 40
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023
- ඇගයීම් සඳහා නිර්ණායක : ඉංජිනේරු සැලසුම, පාලමේ බර දරා ගැනීමේ හැකියාව පිරික්සීම සඳහා වූ බර පැටවීමේ පරීක්ෂණය, නිෂ්පාදන පිරිවැය, නියමිත කාලසීමාව තුළ සම්පූර්ණ කිරීම

අත්‍යතා පාලම් සැලසුම් කිරීමේ තරගය පාසල් සිසුන් අතර STEAM අධ්‍යාපන සංකල්පය ප්‍රචලිත කිරීමේ අරමුණින් පරිගණක යොදා ගෙන පවත්වනු ලබයි. පරිගණක මෘදුකාංගයක් භාවිතයෙන් පාලමක් සැලසුම් කිරීමට අවස්ථාව ලබා දීමෙන් ඉංජිනේරු නිර්මාණකරණය සඳහා වූ අත්දැකීමක් තුළින් සිසුන්ට ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හැඳින්වීමක් ලබා දීමට මෙම තරගය මගින් බලාපොරොත්තු වේ. (www.bridgedesigner.org) මෙහිදී ඉංජිනේරු සැලසුම් ක්‍රියාවලිය, සිසුන්ට සරල ස්වරූපයෙන් අවබෝධ කර ගත හැකි වන අතර, සිවිල් ඉංජිනේරුවන් සිදු කරන සැබෑ අධිවේගී පාලම් නිර්මාණය කරන ආකාරයටම ඔවුන්ට පාලමක් නිර්මාණය කිරීමට අවස්ථාව ලැබේ. ඔවුන්ට ලැබෙන ඉලක්කය වන්නේ ප්‍රශස්ත පාලම් සැලසුමක් නිර්මාණය කිරීමයි. ප්‍රශස්ත පාලම් සැලසුමක් යනු නිවැරදි ඉංජිනේරු සැලැස්මක් සහිත බර දරා ගැනීමට හැකි සහ සුලු පිරිවැයකින් ඉදි කළ හැකි නිර්මාණ සැලසුමකි. මෙම තරගය ජාතික විද්‍යා පදනම් පරිශ්‍රයේ දී සංවිධානය කෙරේ.

04. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට අදාළ කොන්දේසි

- **ගායනා, විරිදු, භූමිකා රංගනය, ඩිජිටල් කතාන්දර (වීඩියෝ දර්ශන) සඳහා**

  ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන වීඩියෝ දර්ශනයේ පළමු රාමුවේ තරගයේ නම, සිසුවාගේ නම සහ පාසලේ නම සඳහන් කළ යුතුවේ.

  පටිගත කරන ලද වීඩියෝව ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග 0715188921 ට WhatsApp කිරීම හෝ

ගූගල් අවකාශයේ (Google drive) තැන්පත් කිරීම කළ හැකි අතර V – transfer කර අදාළ සබැඳිය (link) chamarika@nsf.gov.lk and abhimani@nsf.gov.lk යන ලිපිනවලට එවිය යුතුය. WhatsApp මාර්ගයෙන් එවනු ලබන්නේ නම් නිවැරදිව තරගය, පාසලේ නම (නිද- Drama_ Rathanapala MV, Gampaha) එවිය යුතු වේ. ඒ ආකාරයෙන්ම අයදුම්පත ඊමේල් කළ යුතුවේ. (නිද- Competition _ School name)

- නාට්‍ය අත්පිටපත්, විද්‍යා රචනා, විද්‍යා කෙටි කතා (විද්‍යා ප්‍රබන්ධ) සහ පෝස්ටර් නිර්මාණය
  නාට්‍ය අත්පිටපත්, විද්‍යා රචනා, විද්‍යා කෙටි කතා (විද්‍යා ප්‍රබන්ධ) සහ පෝස්ටර් නිර්මාණ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය් සමග එවිය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ "SSC 2023_Competition Name" සඳහන් කර එවිය යුතුය.

- සියලුම ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය : 25.08.2023

- ඉදිරිපත් කරන ලද වීඩියෝපට විශේෂ ඇගයීම් මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ. ජයග්‍රාහයකයන් තේරීමේ දී හෝ ජයග්‍රාහකයන් දැනුම් දීමෙන් පසුව කෙරෙන දුක්ගැනවිලි, අභියාචනා කිරීම, පුද්ගල බලපෑම් පිළිබඳ ව සලකා බලනු නොලැබේ.

- ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන විශේෂ උත්සවයක දී ජයග්‍රාහකයන් ඇගයීම සිදු කෙරේ.

**වැඩි විස්තර**

ලිපිනය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික විද්‍යා පදනම
අංක 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07
දු.ක. : +94112696771 Ext: 185/184, **ෆැක්ස් :** +94 0112694754
**ඊමේල් :** dilrukshi@nsf.gov.lk, abhimani@nsf.gov.lk
**වෙබ් ලිපිනය :** www.nsf.gov.lk